නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

11 ශ්‍රේණිය | නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය | ඒකකය 01 - තුනී ලෝහ තහඩු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. තුනී ලෝහ තහඩු භාවිතා කර පවත්වාගෙන යන කර්මාන්ත මොනවාද?
02. තුනී ලෝහ තහඩුවල තිබෙන යාන්ත්‍රික ගුණාංග නම් කරන්න.
03. තාක්ෂණික දියුණුවත් සමඟ නව නිෂ්පාදන සඳහා තුනී ලෝහ තහඩු යොදා ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වූ කරුණු මොනවාද?
04. ෆෙරස් ලෝහ තහඩු සඳහා උදාහරණ දෙකක් නම් කරන්න.
05. මිශ්‍ර ලෝහයක් යනු කුමක්ද? මිශ්‍ර ලෝහ දෙකක් නම් කර ඒවා සාදා ගැනීමට භාවිතා කළ මූලද්‍රව්‍ය නම් කරන්න.
06. සම්මත කම්බි ආමානයේ (S.W.G) අංක 1 දක්වෙන කම්බියේ විශ්කම්භය කුමක්ද?
07. මිටියක මිට සඳහා කම්පනයට ඔරොත්තුදෙන ලී වර්ගය කුමක්ද?
08. හරස් පෙති මිටියක් භාවිතා කරන අවස්ථාවක් නම් කරන්න.
09. තුනී ලෝහ තහඩු නිෂ්පාදන කර්මාන්තයේදී සට්ටම් වර්ග භාවිතා කරනු ලබන්නේ කුමන හැඩයේ භාණ්ඩ තැනීමටද?
10. මොළොක් පොඩි යනු කුමක්ද? එය සෑදීමට ගන්නා ලෝහ මිශ්‍ර අනුපාතය කුමක්ද?
11. බවුතයක් තඹ ලෝහයෙන් තනා ඇත්තේ කුමන හේතුවක් නිසාද?
12. මොළොක්පොඩියෙන් සහ දැඩි පොඩියෙන් පෑස්සීමේදී භාවිතා කරන ඝාන්ද නම් කරන්න.
13. මිටියම් ඇණ සෑදීමේදී භාවිතා කරන ලෝහ නම් කරන්න.
14. මිටියම් කිරීමේදී භාවිතා කරන ආවුද / උපකරණ කුමක්ද?
15. තුනී තහඩු මූට්ටු කරන මූට්ටු වර්ග දෙක නම් කරන්න.
16. කම්බි වාටිය යනු කුමක්ද?
17. තුනී තහඩු කපා ගැනීමට ගන්නා තහඩු කතුරු වර්ග 4 නම් කරන්න.
18. වැල්ලෙන් පැහැයීම (Sand blasting) යනු කුමක්ද?
19. තීන්ත දියකර ගැනීමට පොදුවේ යොදාගන්නා ද්‍රව වර්ග මොනවාද?
20. ස්ප්‍රේ පේන්ට් ක්‍රමයට තීන්ත ආලේප කිරීමට අවශ්‍ය උපාංග කවරේද?
21. පිත්තල පෘෂ්ට ඔප දැමීමට යොදා ගන්නා ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
22. අමානෝ තහඩුවක් කල් පවතින්නේ කුමක් නිසාද?
23. යාන්ත්‍රික අලංකරණය යනු කුමක්ද?
24. මිටියම් ඇණ වර්ග 3ක් නම් කරන්න.
25. මිලි මීටර 1½ වූ ඝනකම සහිත තහඩු දෙකක් සම්බන්ධ කිරීමට මිටියම් ඇණයේ විශ්කම්භය ගණනය කරන්න. (D = 1.5t)

සැකසුම: ටී.ඒ.එස්. ප්‍රනාන්දු